# ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන විශේෂ දැනුම්දීම

ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන දරු උපතකදී එම දරුවාට කන්සියුලර් උප්පැන්න සහතිකයක් සහ පුරවැසි සහතිකයක් ලබා ගැනීම ශ්‍රී ලාංකික දෙමව්පියන්ගේ වගකීමකි. ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන දරු උපත් වලදී ශ්‍රී ලාංකික පුරවැසි භාවය අයදුම් කිරීම සඳහා දෙමව්පියන්ගෙන් එක් අයකු හෝ ශ්‍රී ලාංකික විය යුතුය.

ඒ අනුව ලංකාවෙන් පිටත සිදුවන දරු උපත්වලදී ශ්‍රී ලාංකික පුරවැසිභාවය අයදුම් කිරීමට අදාළ අයදුම්පත ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට යැවිය යුතුය. සාමාන්‍යයෙන් කන්සියුලර් උප්පැන්න සහතිකය ලබා ගැනීමට අදාළව උපත ලියාපදිංචි කිරීම හා ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අයදුම් කිරීම එකවර සිදු කරනු ලැබේ. ඒ අනුව සම්පූර්ණ කරන ලද පුරවැසි අයදුම්පත අදාළ ඇමුණුම් සහිතව ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පුරවැසි අංශය වෙත යැවීම කොන්සල් ජනරාල් කාර්යාලය හරහා සිදුකරන අතර ඒ සඳහා ඩිරාම් 170/- ක මුදලක් අයකරනු ලැබේ. ඒ අනුව අයදුම්කර මාස 10 ත් 12 ත් අතර කාලයකදී පුරවැසි සහතිකය කොන්සල් ජනරාල් කාර්යාලය වෙත එවනු ලැබේ. පුරවැසි සහතිකය ලබා ගන්නා තෙක් ඒ සඳහා මුදල් ගෙවන ලද කුවිතාන්සිය සුරක්ෂිතව තබා ගැනීම වැදගත්වේ.

දරුවකුගේ පුරවැසි සහතිකය ඉතා වැදගත් ලියවිල්ලක් වන බැවින් එය සුරක්ෂිතව තබා ගැනීම දෙමාපියන්ගේ වගකීමකි. තවද, එම සහතිකය දරුවාට නව ගුවන් ගමන් බලපත්‍රයක් අයදුම් කරන සෑම අවස්ථාවකදීම ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

එමෙන්ම, දරුවාගේ පුරවැසි සහතිකයේ පාද සටහනෙහි සඳහන් වයසට එළඹිවිට, එනම් 2011 වසරට ප්‍රථමයෙන් අයදුම්කළ සහතික සඳහා වයස අවුරුදු 18 ද, 2011 වසරට පසු අයදුම්කළ සහතික සඳහා වයස අවුරුදු 21 වශයෙන්, 1948 නොවැම්බර් 15 දිනැති ශ්‍රී ලංකාවේ පුරවැසි පනතට අනුව ශ්‍රී ලංකාවෙන් පිටතදී ඉපිද ඉහත කී ආකාරයේ පුරවැසි සහතිකයක් ලබාගත් පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පුරවැසි අංශයට ගොස් එම වයසෙන් පසුවද තමා විසින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය රඳවා ගන්නා බවට ප්‍රකාශයක් අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව අදාළ සහතිකය සංශෝධනය වේ.

ඉහත කාරණය අදාළ පරිදි සම්පූර්ණ කිරීමට අපොහොසත්වන පුද්ගලයින් 1948 ශ්‍රී ලංකා පුරවැසි පනතේ විධිවිධාන වලට අනුකූලව, ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ස්වකීය පුරවැසිභාවය ප්‍රතික්ෂේප කරන ලද පුද්ගලයින් වශයෙන් සලකන බැවින් ඔවුන්හට නව ගුවන් ගමන් බලපත්‍රයක් අයදුම් කිරීම හෝ දැනට භාවිතා වන ගුවන් ගමන් බලපත්‍රයෙන් ශ්‍රී ලංකාවට හෝ වෙනත් රටකට යාමට නොහැකි බව අවධාරණය කරනු ලැබේ.

එබැවින් ශ්‍රී ලංකාවෙන් බැහැරව ඉපිද මෙතෙක් සිය ශ්‍රී ලංකා පුරවැසිභාවය රඳවාගන්නේ යැයි ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ අයෙකු වේ නම්, ඉහත 4 වන ඡේදයේ සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් සිය ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ප්‍රතික්ෂේප කිරීමකින් තොරව පවත්වාගන්නේ යැයි ප්‍රකාශය අනිවාර්යෙන්ම ලබා දිය යුතුය.